
# අපූරු අමුත්තා



එච්.ඩබ්.ඔනාරි විහංසා පීරිස්

# අපූරු අමුත්තා

**2023**

**කතෘ ප්‍රකාශනයකි**

**ISBN 978-624-206-882-4**

**කථාව සහ චිත්‍රය**

**එච්.ඩබ්.ඔනාරි විහංසා පීරිස්**

**2 ශ්‍රේණිය E**

**මහාමායා බාලිකා විදුහල**

**මහනුවර.**

**2023.10.20**

# පිදුම

මට  අකුරු  කියවු මාගේ
ආදරණීය අම්මාටත්,
ආච්චිටත්, නිතරම මා
ලගින්ම සිට උදව් කල
මාගේ ආරණීය චූටි
පුංචිටත්,
මට අකුරු උගන්වා හොඳ
නරක කිසා දුන් මාගේ
ආදරණීය ගුරුතුමියටත්
මාගේ පළමු මේ පොත
ආදරයෙන් පුද කරමි!!!


# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත් වන පවුලක් මෙන්ම ප්‍රඥා සම්පන්න දැනුමෙන් යුත් බහු විධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජියක් ගොඩ නැගීම අපේක්ෂා වේ.ඒසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හදුනාගෙන ඒවා ඔපවත් කිරීම තුල ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය. මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාට් දරුවනට ගැළපෙන “දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතිය එක් වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට  මෙම කෘතිය තුළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන් ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි. මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වූ සෙනවිරත්න මහලේකම්ගේ සේවයද අගයමි.

ශෂිකලා සෙනාධීර
(විදුහල්පතිනිය)
මහාමායා බාලිකා විද්‍යාලය- මහනුවර
2023.10.20

අද නම් වහින්න වගේ අපේ අම්මා කිවුවා. එතකොට ම ගොරවන්න පටන් ගත්තා.

අම්මායි මමයි වැලේ තිබ්බ රෙදි ටික ගෙට ගත්තා.



හයියෙන් සුළඟ හමනවා. සුළඟට ගස් වැල් හෙලවෙන දිහා මං හරිම ආසාවෙන් බලා ගෙන හිටියා.



ගෙදර වැට ළඟ තියෙන ජම්බු ගහෙන් මොකක්දෝ වැටෙනවා වගේ මං දැක්කා. මං අම්මා ..... අම්මා..... කියලා අම්මාට කතා කලා.



මොකද ළමයෝ කෑගහන්නේ අම්මා ඇහුවා. ගහේ තිබ්බ මොනාදෝ වැටුණා කියලා මං අම්මට කිවුවා.

ඒ මොකක්ද? අම්මා ඇසුවා.
අනේ අම්මේ බලන්න යමුකෝ
කියලා මං අම්මාට කිව්වා.



හරි යමුකෝ කියලා අම්මා කිවුවා. මම අම්මාට කලින් දුවගෙන ගියා. අනේ වැටිලා තියෙන්නේ ගහේ තිබ්බ ලේන් කූඩුවක්.



ලේන් අම්මා පේන්න හිටියේ නෑ. චූටිම චූටි ලේන් පැටියෙක් කූඩුවේ ඇතුලේ හිටියා. එයා තාම ඇස් ඇරලත් නෑ. වහින්න පටන් ගත්ත නිසා අම්මා ලේන් පැටියාව ගේ ඇතුළට අරන් ආවා.



එයා කෑ ගහන්න පටන් ගත්තා. බඩගිනි වෙලා ඇති නිසා අම්මා කිරි හදලා පෙව්වා. ලේන් පැටියා කිරි ටික ටික බිව්වා.




එදා දවසම මං පුංචි ලේන් පැටියා ළඟට වෙලා එයාව හොඳින් බලා ගත්තා.



ලොකු ලේනෙක් හරිම කලබලෙන් එහාට මෙහාට දුව දුව කෑ ගහනවා ඇසුණා. අම්මා කිවුවා ඒ ඉන්නේ මේ ලේන් පැටියාගේ අම්මා වෙන්න ඇති කියලා.

ඉතින් අම්මා කිවුවා අපි මේ පැටියාව ආයෙමත් ගහෙන් තියමු කියලා. මම නම් ඒකට කැමති වුණේ නෑ. මගේ ඇස් වලට කඳුළුත් ආවා.

ඒත් මට අම්මාව ඕනේ වගේම ලේන් පැටියාටත් අම්මාව ඕනේනේ කියලා මට හිතුණා. ඊට පස්සේ මං සතුටින් ලේන් පැටියාව එයාගේ අම්මාට භාරදුන්නා.



# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔපනැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව **2014** වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත් දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැගීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතක තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි. “දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු!

මෙයට,

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

**2023.10.20**

**ISBN 978-624-206-882-4**